# අපර බ්‍රාහ්මී අභිලේඛනයන්හි ස්වභාවය හා ගිරි ලිපි භාවිතය පිළිබඳ විමර්ශනයක්

ගල්වැවේ විමලඛන්ති හිමි

පීඨාධිපති, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

**Abstract**

It seems a vast different between early brahmi inscriptions and late braghmi inscriptions when considering there nature of established, content, method of writing and the appearing as well. In this article it is going to be discussed of all those differences and it is thoroughly investigate the reason for the difference. Earlier investigators also paid their attention on this case and they have forwarded several interpretations regarding the matter. All available matters are discussed here and physical, technical and scientific reasons also discussed here. The social and ethnic body of that era is also being investigated here and anticipations of people and rulers also discussed to find out the reason for the difference. Social, ethnic, religious and governing methods of the era may have pushed the society to cultivate new and variety of expectations through the discussed era. In this article new theory and method also proposed to read and investigate the inscriptions of the entire era as well.

***Key words:*** Late brahmi, Inscription, society, expectations, investigate, religion

## හැඳින්වීම

ක්‍රිස්තුවර්ෂාරම්භයත් සමගම ශ්‍රී ලාංකේය අභිලේඛනයන්හි විශේෂ වෙනසක් දර්ශනය වේ. අභිලේඛනයන්හි ස්වභාවය, අන්තර්ගතය, ලේඛන සටහන් කළ ක්‍රමයේ විශේෂතා හා ගිරිලිපි භාවිතයට පැමිණීම වැනි විශේෂ වෙනස්කම් රාශියක් මේ යුගයේදී නිරීක්ෂණය කළ හැකි ය. ප්‍රායෝගික හා අන්තර්ගතය වශයෙන් විවිධත්වයට පත්වූ මේ යුගයේ අභිලේඛනයන්හි මූලික වෙනස්කම් නිරීක්ෂණය කිරීමත්, ඒ සඳහා හේතු වූ

කරුණු විභාග කිරීමත් මගින් එකී විපර්යාශයන්ට බලපෑ හේතු විමර්ශනය කිරීම තත් කාලීන සමාජාර්ථික තත්ත්වයන් අවබෝධ කර ගැනීමට බෙහෙවින් මූලාධාර වේ. මේ ලිපිය මගින් තත් කරුණු විමර්ශනාත්මක ව විවරණය කෙරේ.

**අරමුණ**

අපර බ්‍රාහ්මී අභිලේඛන යුගය යනු කුමක්දැ යි හඳුනා ගැනීමත්, තත් යුගයේ ලේඛන ස්ථාපනය කිරීමෙහි විශේෂතා විමර්ශනය කිරීමත්, එකී යුගයේ අභිලේඛනයන්හි අන්තර්ගතයේ මූලික ස්වභාවය විමර්ශනය කිරීමත් මේ පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මේ සඳහා භාවිත කොට ඇත්තේ මෙතෙක් කිසියම් අයෙකු විසින් ප්‍රකාශයට පත් කරන ලද අපර බ්‍රාහ්මී ශිලාලේඛන යි. මේ නිසා මෙහිදී ප්‍රධාන වශයෙන් ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කොට තිබේ.

**සාකච්ඡාව**

ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමග සටහන් වූ ශිලා ලේඛනවල ඉතා ප්‍රකටව දැකිය හැක්කේ ඒවායේ වස්තු විෂය හා ලේඛන ක්‍රමය ඇතුළු සමස්ත සංයුතියම වෙනසකට භාජනය වූ ආකාරයෙකි. මේ යුගයේ ශිලා ලේඛනවල ලේඛන සටහන් කළ තාක්ෂණය ද බොහෝ වර්ධනයක් පෙන්නුම් කරයි. එහෙත් ඒ වෙනුවෙන්ම සිනිඳු කොට නිමවූ පෘෂ්ඨයක් මත ශිලා ලේඛන සටහන් කිරීමක් සිදුව නොමැත. අක්ෂර රූප පරිමාණය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ද පැහැදිලි වෙනස්කමක් මෙම යුගයේ ශිලා ලේඛනවල දිස් වේ. මේ නිසා ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ අග භාගයේ ඉතා ස්වල්ප වශයෙන් වර්ධනය වෙමින් ආ අක්ෂර රූප රටාවේ වෙනස්කම් ද මෙම යුගය තුළ නිරීක්ෂණය කළ හැකිය. ප්‍රධාන වශයෙන්ම මෙම යුගයේ දිස්වෙන ශිලා ලේඛනවල අන්තර්ගතය, වේගවත් වර්ධනය ද ඉතා ප්‍රකට තොරතුරු ප්‍රමාණයක් ගෙන ඒමට සමත් වූ ප්‍රමාණාත්මක තත්ත්වයකට ඔසවා තබන ලද බව ද ප්‍රත්‍යක්ෂ වේ. මෙහිදී ප්‍රධාන වශයෙන්ම විමර්ශනය කිරීමේ දී පැහැදිළි වන්නේ සෑම ආකාරයකම විෂය විශේෂතා ප්‍රදර්ශනයක් කරනු ලබන ශිලාලේඛන ප්‍රමාණයක් මෙම යුගයේදී දැකිය හැකි බව යි.

**අපර බ්‍රාහ්මී යුගය**

මෙම පර්යේෂණයේදී අපර බ්‍රාහ්මී යුගය වශයෙන් ගැණෙන ශිලාලේඛන හෝ අභිලේඛන භාවිත කරනු ලබන නියත කාලය සීමාකර ගැනීම අතිශයින්ම වැදගත් වේ. සාමාන්‍යයෙන් අපර බ්‍රාහ්මී යුගය වශයෙන් ගැණෙන අභිලේඛන අයත් කාලපරිච්ඡේදය කෙබඳුදැ යි විමර්ශනය මෙහිදී අත්‍යාවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ දැකිය හැකි බ්‍රාහ්මී අක්ෂර මාලාව යම් යුගකරණයකට ලක් කිරීමේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි බෙදීමක් පළමුවෙන් ඉදිරිපත් කරන ලද්දේ පී.ඊ.ඊ. ප්‍රනාන්දු මහාචාර්යවරයා විසිනි. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම බ්‍රාහ්මී අක්ෂර මාලාව සිංහල අක්ෂර මාලාව දක්වා දියුණු වීමට බලපෑ කරුණු පිළිබඳව එතුමා කළ පර්යේෂණ බෙහෙවින්ම බලපෑවේය. එහෙත් මෙම බෙදීම සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේ

සී.ඩබ්ලිව්.නිකොලොස් විසින් සකස් කරන ලද අක්ෂර රූප රටාවෙහි පරිණාමය පිළිබඳ අක්ෂර සංකේත සටහනයි. ප්‍රනාන්දු දක්වන ආකාරයට ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. පළමුවන සියවසේ ප්‍රථමාර්ධය දක්වා ආදී බ්‍රාහ්මී යුගය ලෙසත්, එතැන් සිට ක්‍රිස්තු වර්ෂ සත් වන සියවසේ අවසාන භාගය දක්වා පශ්චාත් බ්‍රාහ්මී අවධිය වශයෙනුත් නම් කරනු ලබයි. (Fernando:P.E.E:1949:UCR:Vol.Vll.294) එහිදී අක්ෂර මාලාවේ සිදු වූ විශේෂ ලක්ෂණ හතක් යටතේ එතුමා කරුණු දක්වා තිබේ. අක්ෂර මාලාවේ රූපමය වෙනස් කම් මේ සඳහා බෙහෙවින් බලපා තිබේ.

01. සිරස් රේඛා සහිත අකුරු වලට එම රේඛාව මත "ඉහ" නමින් හඳුන්වනු ලබන තිරස් රේඛාවක් එකතුවීම.

02. සිරස් රේඛාවල පහළ කෙළවර දීර්ඝ වීම. ඇතැම් විට මේවා දීර්ඝ වී ගොස් වම් අතටත් නැවී යාමක් දක්නට ලැබේ.

03. "ල" අක්ෂරයේ දකුණු සිරස් රේඛාව ඉහලට දික් වී ගොස් ඇතැම් විටක දකුණු පැත්තටත් පසුව වම් පැත්තටත් වක් වීම.

04. "ඩ" සහ "ළ" යන අක්ෂරවල පහළ කොටස දකුණු පැත්තට විවෘත වී වක් වීම.

05. "ව" සහ "ම" අක්ෂර වල වෘත්තාකාර අතු ඇතැම්විට ත්‍රිකෝණාකාර වීම.

06. ආදී බ්‍රහ්මී යුගයේදී අසමාන උසින් යුතු සිරස් රේඛා දෙකක් සහිත අකුරුවල අතු උසින් එකිනෙකට සමාන වීම.

07. කෝණාකාර අකුරු සහ අකුරුවල කෝණාකාර අතු රවුම් හැඩයක් ගැනීම. "එ" "ග" සහ "ත" මේ අයුරින් වෙනස් වූ අකුරු ය. (එහෙත් නිකොලස්ගේ රූප සටහනෙහි "එ" අක්ෂරයේ මෙම කවාකාර රූපය නොදැක්වේ. (ibid(294)

මෙම තොරතුරුවලින් සනාථ වන්නේ ලම්බකර්ණ රාජ වංශිකයින්ගේ අවධියේදී අක්ෂර මාලාවේ භෞතික වශයෙන් අති විශාල විපර්යාශයක් සිදුව තිබෙන බවයි. කෙසේ වෙතත් මෙම යුග බෙදීම පිළිබඳ එකඟ විය නොහැකි තැන් තිබේ. එනම් ක්‍රි.ව. 4 වැනි සියවස අවසානය වන විට අක්ෂර රූපවල තව තවත් වෙනස්කම් සිදුවනු පෙනේ. මේ නිසා ඇතැම් පඬුවෝ මෙම යුගය හෙවත් ප්‍රනාන්දු 'පශ්චාත් බ්‍රාහ්මී යුගය' වශයෙන් හඳුන්වනු ලැබූ යුගය තවත් කොටස්වලට කඩා අර්ථ දක්වනු පෙනේ.

විල්හෙල්ම් ගයිගර්ගේ අදහස මීට වඩා මදක් මඳක් වෙනස් ස්වරූපයක් ගනී. ඒ අනුව ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.පූ. 4 වන සියවස තෙක් බ්‍රාහ්මී ලිපි වශයෙන් දක්වයි. මෙහිදී බ්‍රාහ්මී නමින් වූ අක්ෂර සිංහල අක්ෂර බවට පරිවර්තනය වීමට පෙර යුගය වශයෙන් භෞතිකව එතුමා සලකා මෙම තීරණයට එළැඹ තිබෙන බව පසක් වේ. එයිනුදු මෙකී යුගය සිංහල ප්‍රාකෘත යුගය වශයෙන් එතුමා නම් කරයි. (ගයිගර්. ඩබ්. 2001ඃ බලගල්ලේ. විමල්. ජී. පරිඃ 35)

මේ පිළිබඳව සඳහන් කරන විමල් ජී බලගල්ලේ ගයිගර්ගේ මතය මද වශයෙන් සංශෝධනය විය යුතු බව දැක්වුව ද එය සංශෝධනය විය යුතු ආකාරය නොකියයි. එය

සාමාන්‍ය අවබෝධයක් ලබා ගැනීමට ප්‍රමාණවත් වන්නක් බව එතුමා කියයි. (බලගල්ලේ. විමල්. ජී. 1998: 31) මෙම පඬුවන් දෙදෙනාගේම මෙම බෙදීම හුදෙක් භාෂාවේ වාග් විද්‍යාත්මක ස්වරූපය පදනම වශයෙන් ගෙන කළ බෙදීමක් බව මෙහිදී වටහා ගත යුතුව ඇත.

නන්දසේන මුදියන්සේගේ අදහස වන්නේ ක්‍රි.පූ. පළමු වන සියවසේ මැද භාගයේ සිට පස්වන සියවස දක්වා කාලය බ්‍රාහ්මී අක්ෂර මාලාව විකාශය වී තිබෙන දෙවන අවස්ථාව වශයෙන් සැලකිය හැකි බවයි. තව ද එය සිංහල අක්ෂරවලට පෙරලීමේ කාලය හත්වැනි (07) ශතවර්ෂය දක්වා දිගු කළ යුතු බව එතුමා පෙන්වා දෙයි. (මුදියන්සේ.එන්.2018:21) එසේම එම කාල පරිච්ඡේදය තුළ අක්ෂරමාලාව සිදු වූ වෙනස්කම් එතුමා සංග්‍රහ කරයි. ඒ කරුණු හතක් පදනම් වශයෙන් ගැනීමෙනි. ඒ අනුව

01. ලම්බාකාර රේඛා ඇති අක්ෂරයන්හි එකී රේඛාව මුදුනෙහි කුඩුම්බියක් වැනි ලක්ෂණයක දැක්වීම. ඇතැම්විට "ග" අක්ෂරය වැනි අක්ෂරයක පහත කෙළවර පැතිවල ද "ට" කාරය මුදුනෙහි ද "ම" කාරය මුදුන් දෙකෙළවර ද "ය" කාරයෙහි ඇතැම්විට තුන් රේඛාවේහිම මුදුනෙහි ඇතැම් විට මධ්‍ය රේඛාවේහි පමණක් ද "ස" කාරය මුදුනෙහි සහ ඒ හා සමාන්තරව උඩට විහිදෙන රේඛාව මත ද ආදී වශයෙන් මේ ලක්ෂණ මේ යුගයෙහි ප්‍රකටව පෙනෙන්නේය.

02. ලම්බාකාර රේඛා ඇති අක්ෂරවල පහත කොටස දික්වී වමට නැමී යාම.

03. "ල" කාරය දකුණු පසින් උඩට විහිදෙන රේඛාව මුල් යුග වලට වඩා දීර්ඝ වී තිබීම මේ කාලයේ ලක්ෂණයකි. ඇතැම් විට මේ රේඛාව දකුණු අතට නැමී ඇත. බොහෝ විට වම් පසට බරවී වක් විය.

04. "ඩ" සහ "ළ" අක්ෂරවල පහත කොටස් වක්වී දකුණු දෙසට ඇදී ඇත. ක්‍රි.ව. 7 වන ශතවර්ෂයේ දී පමණ "ළ" අක්ෂරය මැදින් ගැටගැසී ඇති බව පෙනේ.

05. "ච" "ම" අක්ෂරවල වෘත්තාකාර පහත කොටස් ත්‍රිකෝණාකාරයක හැඩගෙන ඇත. පසු කාලයේදී එනම් ක්‍රි.ව. 4 වන ශතවර්ෂයේ සිට "ච" අක්ෂරය අලුත් හැඩයකට පෙරලුණි. "ම" අක්ෂරයෙහි මුදුන් කොටස් ක්‍රි.පූ. 4 වන වර්ෂයේදී පමණ පහත කොටස් සමාන විධියට වැසී යාම. ඒ එම අක්ෂරයෙන් වර්තමාන ස්වරූපය පෙරළීම පිළිබඳව මුල් අවධියයි.

06. කෝණාකාර හැඩය ගත් අක්ෂර "ච,ග,ත" වෘත්තාකාර වීම වශයෙන් එතුමා එම විමර්ශනයේදී පැහැදිලි කර දක්වයි. කෙසේ වෙතත් මෙම මත දෙකම මෙම යුගයේ අක්ෂරවල සිදු වූ භෞතික වෙනස්වීම් පිළිබඳව දක්වන අදහස් වුව ද සමාන ලක්ෂණ වලින් යුක්ත බව ද දැක්විය හැකිය.

ලම්බකර්ණ රාජ වංශිකයන්ගේ යුගය වෙනම කාලපරිච්ඡේදයක් වශයෙන් ගැනීම යුක්ති යුක්ත ද යන විග්‍රහය විමර්ශනය සඳහා මෙහිදී මෙසේ අක්ෂරවල භෞතිකව සිදුවූ පරිණාමය සැලකිල්ලට ගත යුතු වේ. ඒ ඔවුන් ලේඛක පරම්පරාවකින් පැවත එන පිරිසක් බවට අදහස් ඉදිරිපත් වී ඇති බැවිනි.

මේ පිළිබඳව අදහස් දක්වන බන්දුසේන ගුණසේකර මෙම යුග බෙදීම පිළිබඳව වැඩියමක් නොකියයි. එහෙත් සිය "සිංහල අක්ෂර සම්භවය හා එහි විකාශය" නම් කෘතියේදී මූල බ්‍රාහ්මී යුගය "ආදී බ්‍රාහ්මී අක්ෂර ස්වරූපය" වශයෙන් නම් කරයි. එම යුගය ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. පළමුවන සියවසේ මැද භාගය දක්වා ගෙන විමර්ශනය සිදු කොට ඇත (ගුණසේකර.බී.1996:23). එහෙත් දෙවන යුගය වශයෙන් එතුමා පශ්චාත් බ්‍රාහ්මී යුගය වශයෙන් ගෙන සිය අධ්‍යයනය මෙහෙයවා තිබේ. එය ක්‍රි.ව. පළමුවන සියවසේ මැද භාගයේ අතරමැද වශයෙන් ගෙන එතුමා අර්ථ විවරණය කරයි (එම.53-32). එහෙත් එම යුගය නිශ්චිත ලෙස සඳහන් නොකරයි. කෙසේ වෙතත් පශ්චාද් බ්‍රාහ්මී යුගය වශයෙන් එම යුගය නම් කොට තිබෙන බව පසක් වේ. එසේම එතුමාගේ ආචාර්ය උපාධි නිබන්ධනයේදී (The evolution of the Sinhalese Script from the 6th to 10th centrary) ක්‍රි.ව. පළමුවන සියවසේදී අක්ෂරවල රූපාකාරය වෙනස්වීම ආරම්භ වූ බවත්, එය ක්‍රි.ව. දෙවන සියවසේ දී වඩාත් ප්‍රකටව පෙනෙන බවත් සටහන් කරයි. තව ද සිංහල අක්ෂර බවට පත්වීමේදී එය හයවෙනි හා හත් වෙනි සියවස්වලදී වඩාත් ප්‍රකට ව පෙණෙන බවත් දක්වා තිබේ (Gunasekara.B:1999:16). කෙසේ වෙතත් අක්ෂර රූප රටාවෙහි ක්‍රි.ව. පළමුවන සියවසටත් මැදභාගය හා ක්‍රි.ව. පස්වැනි සියවසේ අග භාගය දක්වා වූ කාල පරිච්ඡේදයේ සිදු වූ වෙනස්කම් පිළිබඳව තියුණු නිරීක්ෂණයක් එතුමා විසින් සිදු කොට තිබෙන බව "සිංහල අක්ෂර සම්භවය හා එහි විකාශය" නම් කෘතියෙන් පෙනේ. එහෙත් කාලානුරූපී බෙදීමක් විෂයෙහි තියුණු අදහස් ඉදිරිපත් කිරීමක් කෙරෙහි එතුමා යොමු නොවන බව පසක් වේ.

මෙම කාරණය පිළිබඳව අදහස් දක්වන තෙන්නකෝන් විමලානන්දගේ අදහස වන්නේ ඉන්දීය මෞර්ය අධිරාජ්‍යය කැඩී යාම හේතුවෙන් බ්‍රාහ්මී අක්ෂර මාලාවේ රූපයන් ද බහුල වන්නට වූ බවත්, මෙම යුගයේදීම ලාංකීය බ්‍රාහ්මී අක්ෂර මාලාව ප්‍රථම සිංහල අක්ෂර බවට පෙරළෙමින් වැඩෙන්නට වූ බවත් ය (විමලානන්ද.ටී.1957:48). එසේම පී. ගෝල්ඩ්ස්මිත්ගේ වාර්තාවක් අනුව යමින් විමලානන්ද මෙසේ කියයි. මෙරට ශිලාලේඛන කොටස් කිරීමේදී,

01. බුද්ධාගමය පැමිණීමේ පටන් ක්‍රිස්තුවර්ෂාරම්භය දක්වා

02. ක්‍රිස්තුවර්ෂාරම්භයේ පටන් ක්‍රි.ව. 4 වැනි ශත වර්ෂය දක්වා

03. ක්‍රි.ව. 4 වැනි ශතවර්ෂයේ පටන් ක්‍රි.ව. එකොළොස් වැනි (11) ශත වර්ෂය දක්වා වශයෙනි (විමලානන්ද.ටී.1957:57). තව ද ඔහුගේ ආචාර්ය උපාධි නිබන්ධනයේ (Epigraphy and Paleaography of Ceylon down to Tenth Century A.D) එතුමා මෙම ශිලාලේඛන කාලය අනුව වර්ග කිරීමකට ලක්කොට තිබේ. ඒ මෙසේය.

1. ක්‍රි.ව. 247 - ක්‍රි.ව. 1 සියවස දක්වා.

2. ක්‍රි.ව. 1 සියවස - ක්‍රි.ව. 490 දක්වා.

3. ක්‍රි.ව. 490 - ක්‍රි.ව. 703 දක්වා.

4. ක්‍රි.ව. 703 - ක්‍රි.ව. 1073 දක්වා. වශයෙනි (Vimalananda.T.1951:19-26).

බොහෝ විට මෙම බෙදීම අප පර්යේෂණයේ කාලවකවානුව බෙදීමේ ක්‍රමවේදයට

සමාන වේ. මෙම පර්යේෂණයේ ආරම්භක යුගය ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. 67 දක්වා ගත්ත ද විමලානන්ද එය ගෙන ඇත්තේ පළමු සියවස දක්වා වශයෙනි. එහි යම් දින වකවානුවල ගැටලුවක් තිබේ. එසේම දෙවන යුගය වශයෙන් ක්‍රි.ව. පළමුවන සියවසේ සිට ක්‍රි.ව. 490 දක්වා වශයෙන් තිබීම ගැටලුවකි. ඊට හේතුව වශයෙන් එතුමා දක්වන්නේ පළමු යුගය ලෙන් ලිපි වශයෙන් දක්නට තිබෙන නිසා ඒවා කුලකයක බහාලිය හැකි බවයි. එය ද දේවානම්පියතිස්ස රජුගේ යුගයේ සිට (ක්‍රි.ව.4-3) මහාචූලි මහාතිස්ස රජුගේ රාජ කාලය දක්වායැ යි වෙන් කර දක්වයි (ibid:20).

දෙවන යුගය ලෙස දක්වන කාලය චෝරනාග රාජ්‍ය කාලයේ සිට මහාසේන රාජ්‍ය කාලය දක්වා යැයි පෙන්වා දෙයි. එම යුගය ක්‍රි.පූ. 03 සිය සිට ක්‍රි.පූ. 490 දක්වා ගෙන තිබේ (ibid:21). එතැන් සිට සොත්ථිසේන සිට මානවම්ම යුගය ලෙස ගෙන තිබේ (ibid:24). එතැන් සිට පස්වැනි අග්ගබෝධි රජුගේ රාජ්‍ය කාලයේ සිට (ක්‍රි.ව. 703 සිට පළමු විජයබාහු 1073) දක්වා සිවුවැනි යුගය ලෙස ගෙන තිබේ. මේ සඳහා ශිලා ලේඛනවල අන්තර්ගතය හා ආගමික සමාජ විපර්යාසයන්හි විභේදතා ද සලකා බලා ඇති බව පෙනේ.

සද්ධාමංගල කරුණාරත්නයන් මෙම ශිලා ලේඛනවල කාලය පිළිබඳ පර්යේෂණයේ දී දක්වන අදහස වන්නේ මෙරට පැරණිම ශිලාලේඛනය ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් වන බවයි. තව ද එම දෙවන සියවසට අයත්වන ශිලා ලිපි බ්‍රාහ්මී ලිපි වන අතර එම බ්‍රාහ්මී ලිපි ක්‍රි.ව. 7 වන සියවස දක්වා මෙරට භාවිතයේ පැවති බව පිළිග නියි (Karunarathna.S.1984:05,EZ.Vol.VII). එතැන් සිට මෙම පර්යේෂණයේදී කරුණාරත්නයන් ශිලාලේඛන සාකච්ඡා කොට ඇත්තේ සියවසෙන් සියවසට ශිලාලේඛන භාවිත කරමිනි. ඒ නිසා එහි එන බෙදීම කෘතිම බෙදීමක් වශයෙන් සැලකිය හැකිය.

පරණවිතානයන් ක්‍රි.පූ. යුගයේ සියලු ශිලාලේඛන ක්‍රි.පූ. තෙවන (03) සියවසේ සිට ක්‍රි.ව. 67 දක්වා හෙවත් වසභ රාජ්‍ය සමය දක්වා මූලික යුග වශයෙන් බෙදා දැක්වීමට ලක් කරයි. එහෙත් අනතුරුව මේ ශිලාලේඛන විශේෂ යුගකරණයකට ලක් කළ අතර (Paranavithana.S.1970.int.) රජවරුන්ගේ රාජ්‍ය වර්ෂ ක්‍රමයෙන් ශිලාලේඛනවල පෙනෙන ආකාරයට වෙන් කොට දක්වා තිබේ. මේ නිසා විශේෂ යුගකරණයක් එතුළින් නොදක්නා ලැබෙයි.

අපර බ්‍රාහ්මී යුගයේ ශිලාලේඛනවල ස්වභාවය පිළිබඳව කරුණු සඳහන් කරන කොත්මලේ අමරවංශ හිමියෝ ලක්දිව සෙල්ලිපි නැමැති ග්‍රන්ථයේ දී ප්‍රනාන්දු හා නන්දසේන මුදියන්සේ වැනි අයගේ අදහස් අනුව යමින් සම්පිණ්ඩිත අදහස් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරති. උන්වහන්සේ දක්වන ආකාරයට ලක්දිව සාහිත්‍ය කටයුතු බහුල වීමත් සංස්කෘතයේ ආගමනය හා ඊට සමගාමී මහායාන මතයන්හි සම්ප්‍රාප්තිය ද මේ සඳහා බලපා තිබේ. තවද මානවම්ම රජු නරසීහවර්මන් නැමති පල්ලව රජුගේ රාජ සේවයට බැඳී සිටීම, නාලන්දා ගෙඩිගෙය, ඉසුරුමුණිය කැටයම් හා සිංහල හෝඩියේ ඉක්මන් වෙනස්වීම ද පල්ලව හා දක්ෂිණ භාරතීය ආභාසය ලැබීම නිසා සිදු වූවක් බවට උන්වහන්සේ කරුණු දක්වා තිබේ (අමරවංශ හිමි. කේ. 1969:25).

මේ කරුණු පිළිබඳව පර්යේෂණයක නියුක්ත ඒ. එස්. හෙට්ටිආරච්චි සඳහන් කරන්නේ පරණවිතානයන් සංග්‍රහ කළ Inscription of Ceylon Part I and II භාවිතයෙන් මේ කාල පරාසය නිගමනය කළ බවයි. තව ද ක්‍රි.ව. 100 සිට ක්‍රි.ව. 400 දක්වා හා

වසභ රජුගේ සිට ක්‍රි.ව.67-111 හා පළමු උපතිස්ස රජු දක්වා (ක්‍රි.ව.368-412) යුගය මෙම කාලපරිච්ඡේදය ට ඇතුළත් කළ හැකි බව ඔහු කියයි (හෙට්ටිආරච්චි.ඒ.එස්.1990:59). මෙම කාලයට අයත් ශිලාලේඛන දිගු විස්තර සහිත හා සමාජ තොරතුරුවලින් ගහණ වීතිබෙන බව ද එතුමා දක්වා තිබේ (එම).

කෙසේ වෙතත් මෙම යුගයේ ශිලා ලේඛනවල අක්ෂර මුදුන් ලතාක්‍ෂර වීමට හේතුව වශයෙන් පරණවිතානයන් දක්වන්නේ තල්පත්හි ලිවීමට හුරුවීම නිසා එය ශිලා පෘෂ්ඨයන් මතට ද ආරෝපණය වීමෙන් සිදු වූවක් බවයි (EZ.Vol.IV.P.118). නාගිරිකන්ද ශිලාලේඛනය ප්‍රකාශයට පත් කරමින් පරණවිතාන මේ අදහස් දක්වයි. කෙසේ වෙතත් මෙම යුගයේ අක්ෂරවල ලතාක්‍ෂර හා වක්‍රාකාර රටාවක් දක්නට හැකි වීම විදේශ ආභාසයකට වඩා මෙරට භාවිත ලේඛන ද්‍රව්‍ය භාවිතය හා වේගවත් ලිවීම නිසා සිදු වූවක්ය යන්න ගල්වැවේ විමලඛන්ති හිමියන් විසින් සකාරණව පෙන්වා දී තිබේ (අප්‍රකාශිත නිබන්ධනය).

මේ පිළිබඳව පර්යේෂණයක නියුක්ත වූ ජයසිරි ලංකාගේ ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. 07 වන සියවස දක්වා බ්‍රාහ්මී අක්ෂර සහිත යුගය වශයෙන් පිළිග නී (ලංකාගේ.ජේ.1996:05). එහෙත් එතුමාගේ පර්යේෂණයේදී ද එම යුග සෙසු අනු කොටස්වලට කඩා ගෙන ඇත්තේ යම් කෘතීම ක්‍රමවේදයකට බව ග්‍රන්ථ පරිශීලනයේදී පෙනීයයි. තව ද එහි දෙවන යුගය ක්‍රි.ව. පළමු (01) සියවසේ සිට ක්‍රි.ව. 03 සියවස දක්වා ගෙන ඇත. එහිදී එතුමා අක්ෂර ශෛලිය පිළිබඳව පමණක් සිතා යුග බෙදීම කළ නොහැකි බව පෙන්වා දෙයි (එම:25). එම පර්යේෂණයේ දී ඉන්දීය සමකාලීන අක්ෂර හා ද සංසන්දනාත්මක අධ්‍යනයක් යම් පමණකට සිදුකර ඇති බැවින් එම යුගයේදීම ඊට ද අනුරූප වන ලෙස සකස් කර ගත් බව පෙනේ. එහි තෙවන යුගය ක්‍රි.ව. 4-5 සියවස් ද එතැන් සිට 6-7 සියවස් සහ අවසාන වශයෙන් 08-10 සියවස් ද ගෙන යුග බෙදීම සිදු කර තිබේ (එම:03). මෙම තත්ත්වය විමර්ශනය කිරීමේ දී දැකිය හැකි නිගමනය වන්නේ එකී යුග බෙදීම යම් මට්ටමක කෘතීම ස්වරූපයක් ගෙන ඇති බවයි.

මෙම පර්යේෂණයේදී යුග බෙදීම සිදු කොට ඇත්තේ ප්‍රධාන කරුණු දෙකක් පදනම් කරගෙන ය. එනම් අක්ෂරවල හැඩයේ වෙනස් වීම මත (Epigraphy) හා පුරාක්ෂර විද්‍යාත්මක (Paleography) යන සිද්ධාන්ත මත පිහිටා අක්ෂරවල හා භාෂාවේ සිදුවූ විෂමතා මත එළඹිය හැකි නිගමනයක් එක් අංශයක බාහාලීමෙන් හා ශිලා ලේඛනවල අන්තර්ගතය හා ඒවා ප්‍රදර්ශනය කිරීමේ ප්‍රමුඛ අපේක්ෂාව පාදක කරගෙන යුගයෙන් යුගය සිදුවූ අන්තර් සම්බන්ධතාවල ද සම විෂමතා අධ්‍යයනයක් යන කරුණු දෙකම පාදක වශයෙන් තබා ගනිමිනි. තව ද ක්‍රි.ව. 429 වර්ෂයේ දී මෙරට ලම්බකරණ රාජ වංශිකයින්ගේ පාලන කාලය ද අවසන් විය. මෙනිසා දෙවන පරිච්ඡේදය එහෙම පිටින්ම ලම්බකර්ණ රාජ වංශිකයන්ගේ ශිලාලේඛන අධ්‍යයන ආශ්‍රයෙන් සමාජය හා ඊට අයත් වෙනත් සාධක සාකච්ඡාවට යොමු වේ. එම රාජවංශය සතුව විශේෂතා ප්‍රදර්ශනය කරන බැවින් එලෙස බෙදා ගැනීම වඩාත් උචිත බව සඳහන් කළ හැකිය. අනතුරුව එන පරිච්ඡේදය ප්‍රධාන වශයෙන් රාජ්‍ය වර්ෂ සම්බන්ධයක් දක්නට ලැබෙන්නක් නොවන බැවින් මෙම පර්යේෂණයේදී එම කොටස වහරල ලිපි හා ආරාම වෘත්තියට අදාළ අනෙකුත් ශිලාලේඛන වශයෙන් භාවිතයට ගෙන තිබේ. එහිදී ප්‍රධාන වශයෙන් අන්තර්ගතය හා සමාන්‍ය මහජනයා ආරාම ආශ්‍රිත කටයුතුවලට ද දායක වීමේ ස්වභාවය ද භාවිතයට ගෙන ගෙන එම කාල පරිච්ඡේදය වෙන් කරනු ලැබ තිබේ.

**ශිලාලේඛන ස්වභාවය හා ශිලා ලිපි භාවිතය.**

මෙම යුගයට අයත් ශිලාලේඛනවල ස්වභාවය හිටි හැටියෙන් ම වාගේ වෙනස් ස්වරූපයකට පැමිණෙයි. ලෙන්ලිපි වෙනුවට ගිරිලිපි භාවිතය වැඩි වශයෙන් දර්ශනය වේ. මූල බ්‍රාහ්මී යුගයේදී ද ගිරිලිපි කීපයක් ලැබිණි. එයින් වඩාත් ප්‍රකට ගිරිලිපි ලැබී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයට අයත් තෝනිගලිනි (Paranavithana.S.1970:32). එහි ද විහාරයට වැවක් පිදීම පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි (ibid). එහෙත් බොහෝමයක් ශිලා ලේඛනවල අන්තර්ගතය වූයේ ලෙන් සකසා භික්ෂූන් වෙත පිදීමයි. මෙම ක්‍රමවේදය වසභ රාජ්‍ය සමය (ක්‍රි.ව.67) වන තෙක්ම භාවිතයේ පැවතිණි. එහෙත් ඉන් අනතුරුව දිස් වනුයේ ඊට වඩා වෙනස් වස්තු විෂයයක් සහිත ශිලාලේඛන ස්ථාපනය කිරීමේ ක්‍රමවේදයයි. වෙනසක් දිස්වෙන, ඒ සඳහා භාවිත පෘෂ්ඨය වෙනස්කම්වලින් යුක්ත වන හා අන්තර්ගතය ඉතා විශාල වශයෙන් වෙනසකට භාජන වූ යුගයකි. මෙම තත්ත්වය ලම්බකර්ණ රාජ වංශිකයින්ගේ ආරම්භයත් සමගම දර්ශනය වීම ද මෙහි ලා විමසිල්ලට ගත යුතු කරුණකි. පරණවිතානයන් ලම්බකර්ණයන් ලේඛක පරම්පරාවකින් පැවත එන්නේ යැයි ගෙන එන මතය ද ඉතා සැලකිය යුත්තක් වශයෙන් හැඟෙන්නේ මෙම යුගය ශිලාලේඛනවල රචනය හා අන්තර්ගතය විමසීමට ලක් කිරීමේදී ය.

එසේම මෙම මතය මඳක් වෙනස් කිරිමට සමත් ලජ්ජතිස්ස මහරජුගේ රාජ්‍ය කාලයට අයත් පෙළි හතකින් යුක්ත තවත් ශිලාලේඛනයක් කැලෑපිටිමුල්ලෙන් හමුව තිබේ (විමලබන්ති.ජී.2016:126-145). කැලෑපිටිමුල්ල පිහිටියේ ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ආසන්නයේ හුණුමුල්ල නම් ග්‍රාමයට යාබදව ය. මෙහි ශිලා උද්ගතයන් නොවේ. පිහිටීම වශයෙන් සම භූමියකි. මේ නිසා එම ස්ථානයට යම් ප්‍රදේශයකින් (කිලෝමීටර් 03ක් පමණ) ගෙන එන ලද ශිලා ඵලකයක පේළි 07 කින් යුතුව මෙම ලේඛනය සටහන් කොට තිබේ. මෙම ශිලාලේඛන පිහිටි ස්ථානයේ ආරාමයක නටබුන් තිබී විනාශ කොට දමන ලද බවට සාධක තිබේ. එහි සටහන්ව ඇත්තේ පේළි 07 කින් යුත් ලිපියකි. මෙය ලජ්ජිතිස්ස මහ රජුගේ නාමය සහිතව ම සටහන් කළ නිසා වැදගත් ලේඛනයක් වශයෙන් සැලකිය හැකිය.

01. තිබවිටි (වෙ) හෙරි නියත

02. තිබ නග මදහ කරිස

03. ලවිය මගු මහරතලි (ෙ) දපති බු

04. කු සගයකය ලවතල ජින මහ

05. රජෙ මවෙරගම පරිබජි (අ) ගි

06. ලජිතිස මහරජෙ චතරි ප

07. චසෙහි නයවය දිනි (එම.129) වශයෙනි.

මෙම ලේඛනය ඉතා පැහැදිලිව ලජ්ජතිස්ස මහ රජුගේ (ක්‍රි.පූ.119-109) රාජ්‍ය කාලයට අයත් වේ. මේ රජුගේ නාමය එම ශිලා ලිපියේ ඉතා ප්‍රකට ව පැහැදිලිව ද දක්වා තිබේ. මේ නිසා ශිලා ඵළක මත මඳක් විස්තර සහිතව ශිලා ලේඛනවල තොරතුරු

සටහන් කිරීම ක්‍රි.පූ. පළමුවන සියවසෙහි සිදුවූයේයැ යි දැක්වීම ද සර්ව සාධාරණ නොවේ. එහෙත් වැඩි වශයෙන් සිදු වූයේ එම යුගයේදී බව පිළිගත යුතුය.

මෙම ශිලාලේඛනයේ තිබ්බිටි විහාරයේ ස්තූපයට නාග මදගෙන් කරීෂයක් දුන් බව කියැවේ. සංඝයාට මංගල මහා ඇළෙන් (මගු මහරනලි) බදු දෙකක් ලබා දුන් බව ද කියැවේ. ලවතල නම් ස්ථානය හෝ එනම් (රජුගේ) දියණිය මචෙරගම පරිභෝජනය කරන්නේ (ප්‍රාදේශීය පාලනයක යෙදෙන්නේ) ලජ්ජතිස්ස මහරජු විසින් සිව්පස පාරිභෝජනය සඳහා නියම කට දුන් බව මෙහි පැහැදිලිව සටහන් කොට තිබේ. මේ නිසා මෙම යුගයට අයත් ශිලාලේඛනවල සටහන් තොරතුරුවලට බොහෝ විට සමාන වස්තු විෂය ද මෙම යුගය ආරම්භයට වසර සියයකට එකසිය පනහකට (100-150) පෙර සිටම භාවිතයේ පැවති බව පිළිගැනීමට සිදුවේ. එහෙත් ශිලා ලේඛනවල අන්තර්ගතය මේ ලෙස වඩාත් විවිධාංගීකරණයට භාජනයවූයේ ලම්බකර්ණ වංශික රාජ යුගයේදී බව ප්‍රකට කරුණක් වේ.

ශිලා ලේඛන සටහන් කරන ලද පෘෂ්ඨය පිළිබඳව විමසීමේදී කටාරම යටින් හෝ උඩින් හෝ පැත්තකින් හෝ මෙම යුගයේ ශිලාලේඛන සටහන් කරන ලද්දේ නොවේ. ඒවා ගිරිලිපි වශයෙන් පාෂාණ උද්ගතයන් ඇති ස්ථානවලදී එම ගිරි පෘෂ්ඨය මත ද එසේ නොමැති අවස්ථාවලදී පාෂාණවලින් බිඳගත් සමතලා පුවරු මත ද මෙම ලේඛන සටහන් කොට තිබේ. පිහිටි ශිලා පර්වත මත සටහන් කළ අවස්ථාවල දී ඒවාට "ගිරිලිපි" යන නාමය භාවිත කෙරේ. එසේ නොමැති අවස්ථාවල දී ගල් පතුරක් වශයෙන් සකස් කළ හෝ භාවිත කළ ශිලා පෘෂ්ඨයක් මත ලේඛන සටහන් කර ඇති අවස්ථාවලදී ඒවා "පුවරුලිපි" වශයෙන් නාමකරණය කරනු ලැබේ. මේ යුගයේ ඉතා දීර්ඝ ලේඛනයන් පැවති අතර තෝනිගල ශිලාලේඛනය (EZ.Vol.III.177) ඒ සඳහා කදිම නිදසුනකි. මේ නිසා ලේඛන රචිත පෘෂ්ඨය මෙම යුගයේ දී වෙනස් වේ. බොහෝ විට ශිලාලේඛන පිහිටි ගල්තලාවල කොටන ලද බැවින් හා නිබඳවම අව් වැසි සුළංවලට නිරාවරණය වන බැවින් ඒවායේ කල් පැවැත්ම ද බෙහෙවින් අඩු වී තිබේ. ලෙන්ලිපි සේ සමස්ත අක්ෂර සහිතව හමු වනුයේ ඉතාමත් කලාතුරකිනි. ශිලාලේඛන සටහන් කිරීමේදී ප්‍රධාන වශයෙන්ම අදාළ පෘෂ්ඨය එම ලිපිය සඳහා ප්‍රමාණවත් ද නැද්ද යන්න පවා පළමුවෙන් පරීක්ෂාකොට නොබලා කළ ලේඛන ද වේ. ශිලා ලේඛනයක් පිහිටවනුයේ එම විහාරයට හෝ ස්ථානයට නිතර පැමිණෙන අයවලුන්ට පහසුවෙන් බලාකියා ගැනීමටය. මේ නිසා පඩි පේළියක් අසල හෝ යම් ප්‍රකට විහාර ගෙයක් අසල ලේඛන සටහන් කිරීමට සිදුවේ. මේනිසා මෙම යුගයේ ලේඛන බොහෝවිට ආදාළ ස්ථානයේ හෝ විහාරාරාමයේ වඩාත් ස්ථායී ශිලා මස්තකය වෙතට යොමුවීමට සිදුවී තිබේ. මේ නිසා බොහෝ විට පෘෂ්ඨයේ ප්‍රමාණය හෝ එහි කල් පැවැත්ම පිළිබඳව විමසිලිමත් වනවාට වඩා අදාළ ස්ථානය නිතර නෙත ගැටෙන කුමක් හෝ ස්මාරකයක් අසල පැවතීම වඩාත් ප්‍රායෝජනවත් වී තිබේ. මේ නිසා ප්‍රධාන වශයෙන්ම මෙම යුගයේ ශිලා ලේඛනවල කල් පැවැත්ම පිළිබඳ ප්‍රශ්න මතුවී තිබේ. තව ද ශිලා මස්තකයන්හි මේවා සටහන් කර තිබෙන නිසා නිදන් සොයන්නන්ගේ නිබඳ ග්‍රහණයට හසු වීම ද මෙහි ලා ඒවා අසම්පූර්ණ හෝ ගෙවීගිය හෝ විනාශ වී ගිය ලේඛන බවට පත්වීමට හේතු වී තිබේ. අනෙක් අතට අනුරාධපුර යුගයේ මුල් වකවානුව නියෝජනය කරන බොහෝ විහාරාරාම මේ යුගය වන විට වල්බිහිව හෝ විනාශයට පත්ව තිබේ. නොඑසේනම් නැවත ජනාවාස වීම නිසා දැන හැඳින ගැනීමට නොහැකිව විනාශමුඛයට ලක්ව තිබේ. මේ මෙම යුගයේ සමාන්‍ය වශයෙන් ශිලා ලේඛනවල පොදු ස්වභාවයයි. එහෙත් මේ වන විට සොයාගෙන ඇත්තේ

ප්‍රකාශයට පත්ව තිබෙන හා නවීන වශයෙන් සොයා ගන්නා ලද ශිලාලේඛන ආශ්‍රයෙන් ප්‍රමාණවත් තොරතුරු සපයා ගත හැකිව තිබේ.

අනෙක් විශේෂ කාරණය වනුයේ මෙම යුගයේ ශිලා ලේඛනවල "සිද්ධම්" වශයෙන් වචනයක් අන්තර්ගතව තිබීමයි. මූල බ්‍රාහ්මී යුගයේ ශිලා ලේඛනවල නොදක්වන ලද බැඳි අකුරු භාවිතයක් ද මෙම වදන නිසා මෙම යුගයේ ශිලා ලේඛනවල අන්තර්ගතව තිබේ. මෙම වදන මෙම යුගයේ අභිලේඛනවලට ම ආවේණික වචනයකි. පී.ඊ.ඊ. ප්‍රනාන්දු ප්‍රකාශ කරන්නේ මෙම මංගල සූචක වදන මෙම යුගයේ පැවති ඉන්දීය ආන්ද්‍ර දේශීය සබඳතා නිසා මෙරටට ආනයනය වූ වදනක් බවයි (Fernando.P.E.E.1949:295). වික්‍රමසිංහ සඳහන් කරන ආකාරයට වෙස්සගිරි ලිපිය තුළ මෙම වදන "සිධ" වශයෙන් යෙදී තිබේ. තව ද ඔහු ක්‍රි.පූ. ශිලාලේඛනවල කිසි ලෙසකින් නොයෙදුණු මෙම වදන මෙරට ක්‍රි.ව. 8 වන සියවසේ ශිලා ලිපිවල යෙදී තිබෙන බව කියයි. එසේම අශෝක අධිරාජයාගේ ශිලාලේඛනවල ද මෙම වදන යෙදී නොමැත. එහෙත් බටහිර ඉන්දියාවේ අමරාවතියෙන් සොයාගත් දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ක්‍රි.පූ. දෙවන සියවසට අයත් ශිලා ලේඛනයක මෙම වදන "සිද්ධම්" වශයෙන් යෙදී ඇති බව පෙන්වා දෙයි (EZ.Vol.I.1912:22). ජී.බියුලර් මේ පිළිබඳව සඳහන් කරන්නේ (Indian Antiquary Vol.X) සඳහා ලිපියක් ඉදිරිපත් කරමින් (A Note on the ward siddham used in iuscriptions) මෙම වදන පුරාණ සංස්කෘත හා ප්‍රාකෘත ශිලාලේඛනවල යෙදෙන්නක් බව කියයි. සංස්කෘත භාෂාවේ "සිද්ධම් නමෝ භගවතෝ" වශයෙන් මෙම වදන යෙදේ (I.A.Vol.X.1881:273). තව ද "ඕං නමෝ අරහතෝ මහා වීරස්‍ය" වශයෙන් ද යෙදී තිබේ (ibid). කෙසේ වෙතත් මෙහිදී ජී. බියුලර් පැහැදිලිව මෙම වදනින් "මංගල" සූචනයක් සිදු කොට ඇති බව ප්‍රකාශ කරයි (ibid). තව ද "සිද්ධම්" යන වචනය "සිද්ධඃ" වශයෙන් ද යෙදී ඇති බව ඔහු පෙන්වා දෙයි. මේ වදන "සිද්ධම" වශයෙන් යෙදී ඇති ස්ථානයක් (Delhi pillers) දිල්ලි පුවරු කෙටි ලේඛනවල හමුවේ. එහි (F/H) "සිද්ධම" වශයෙන් යෙදී තිබේ (ASRA:Vol.V:1875:plxli). බාගේස් සහ බාග්වාන්ලාල් ඉන්ද්‍රජී විසින් සංස්කරණය කරන ලද බටහිර ඉන්දියාවේ ලෙන් ලිපිවල (The cave temples of western India) "සිද්ධථෙ" වශයෙන් මෙම වදන යෙදී තිබේ. මේවා ද ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මී ශිලාලේඛන මෙන් ඉතා කුඩා ලේඛන වර්ගයකි. එහි හතරවන ලිපියෙහි "සිද්ධං" වශයෙන් ද පස්වන ලිපියෙහි "සිද්ධං ථෙරණං" වශයෙන් ද යෙදී තිබේ (Burgess J; Bhagwanlal I; 1381:-05-07). නාගාර්ජුනකොණ්ඩ ශිලා ලේඛනවල මෙම වදන යෙදී ඇත්තේ "සිධම්" වශයෙනි. එම ශිලා ලේඛන බොහෝවිට සංස්කෘත භාෂා ඌරුව සහිතව සටහන්ව තිබෙනු නිරීක්ෂණය කළ හැකිය (E.I.Vol.XX:1933:16). එබැවින් මෙම වදන සංස්කෘත හා මාගධී ඌරුව සහිතව ඉන්දීය ලොකු කුඩා ලිපි රාශියක යෙදී තිබෙන බව ප්‍රකට වේ.

ශ්‍රී ලාංකේය නිදසුන් ගෙන බැලීමේදී පළමුවෙන් මෙම වදන හමු වන්නේ ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමගයි. එම වදන "සිද්ධම" වශයෙන් යෙදුන ද ලංකාවේ "සිද්ධම" වශයෙන් සිංහල ප්‍රාකෘත භාෂාවෙන් යෙදී තිබේ. තව ද එහි විවිධාකාර රූප ද දිස් වේ. මේ නිසා ලාංකීය නිදසුන් බොහෝ විට ඉන්දීය නිදසුන් වලට වඩා විවිධාකාර තත්ත්වයක් පෙන්වනු ලබයි. මෙම වදනේ සම්පූර්ණ රූපාකාරය සහිතව ම යෙදෙන විට නම් එය "සිද්ධම" වශයෙන් යෙදේ. මෝලාහිටියවෙලේගල ශිලා ලේඛනයේ එය යෙදී ඇත්තේ "සිද්ධම" වශයෙනි (Paranavithana.S.1983:05). එහෙත් මීන්විල ශිලා ලිපියේ එ යෙදී ඇත්තේ "සිද්ධ" වශයෙනි (ibid:40). "සිධම" වශයෙන් මෙම වදන

යෙදුණු අවස්ථාවක් මිහින්තලේ ගිරි ලිපියකින් ලැබෙයි (ibid:33). එහි ම තවත් රූපයක් "සිදම" වශයෙන් අල්ප "ද" යන්න භාවිතයෙන් ආඬියාගල ලෙන් ලිපියකින් ලැබෙන නිදසුනකින් දිස්වේ (Paranavithana.S.1970:88).

පොළොන්නරුවෙන් ලද ලෙන් ලිපියක එය සටහන්ව ඇත්තේ "සිද" වශයෙනි (ibdi:93). වල්ලිපුරම් රන්පත් ලිපියේ එය යෙදී ඇත්තේ ''සිධ'' (Paranavithana.S.1983:81) වශයෙනි. දක්ඛිණථූප ගිරි ලිපියක එම වදන සටහන්ව ඇත්තේ "සිථ" වශයෙනි (E.Z.Vol.V:1955:69). මුතුගල්ලෙන් ලද ලිපියක සටහන්ව ඇත්තේ "සි" අක්ෂරයෙන් පමණි. එසේම එම වචනයේ අක්ෂර මාරුවී "සිමධ" වශයෙන් යෙදුණු අවස්ථාවක් හැබැස්ස ගිරි ලිපියෙන් ලැබේ (ibid:05). කෙසේ වෙතත් කොන්ග්‍රායන්කුලම ලිපියෙහි එය යෙදී ඇත්තේ "සිබ" වශයෙනි (Rev.Wimalakhanthi.G.2014:330). මේ නිසා පැහැදිලි වන්නේ එය ශ්‍රී ලාංකේය ශිලා ලේඛනයන්හි විවිධ රූපයන්ගෙන් යෙදී ඇති බවයි. එසේ වීමට හේතුව එම වචනයේ අර්ථය ගෙන ඊට සමාන රූපාකාර වදන් යෙදීම හා වචනයේ කෙටි වදන් ද භාවිතයට ගැනීමයි. තව ද ගල් වඩුවාට අක්ෂර මාරුවී සටහන් වූ තැන් ද මේ අතර වේ.

මේ යුගයේ ශිලා ලේඛනවල අන්තර්ගත පරමාර්ථයන් ද විමර්ශනයට භාජනය කළ යුතු වේ. මෙහි මුලින් දක්වා ඇති පරිදි ලම්බකර්ණ රාජ වංශිකයන්ගේ පාලන කාලය තුළ මෙරට විශාල ප්‍රමාණයේ වාරි ව්‍යාපෘති සෑදීම, ඇළවේලි බැන්දවීම හා ජනතාවගේ සුබ විහරණය උදෙසා රාජ්‍ය දායකත්වය ලබාදීම කැපී පෙනේ. ඒ අතරම මෙරට ස්වාභාවික ගිරි ගුහා ආශ්‍රිතව පැවති ආරාම පද්ධතිය භික්ෂු ජනගහනය පුළුල් වීම නිසා විවෘත භූමි තුළ ඉදිකළ විහාර ආරාම වෙත සේන්දු වන්නට විය. මේ තත්ත්වය ශීඝ්‍රයෙන් සංඝ සමාජයේ ව්‍යාප්තිය උදෙසා ද හේතු වූ බව පෙනේ. එසේම උන් වහන්සේලාගේ හා විහාරස්ථානවල යැපුම් රටාව හා නඩත්තුව උදෙසා ද ක්‍රියාත්මක වන්නට පාලකයින්ට සිදුවිය. මේ නිසා විවිධ දේ ආරාම වෙත පිදූ අතර නව ආරාම ඉදි කිරීමට සිදුවිය. ඒ සියල්ලක්ම වාර්තා කර තැබීම හා ජනයාට ප්‍රදර්ශනය කිරීමත් එමගින් ජනතාව සෙමෙහි පවත්වා ගැනීමත් රජවරුන්ගේ අපේක්ෂාවන් අතර වූ බව පෙනේ. මේ නිසා සටහන් කළ ශිලා ලේඛනවල ස්වභාවය, විෂය පථය හා අන්තර්ගත කරුණුවල විශාල වෙනසක් දර්ශනය වේ. එහෙයින් එම ලේඛනවල පරිත්‍යාගශීලියාගේ නාමය අමරණීය කර ගැනීම, පරිත්‍යාග කළ දෑ පිළිබඳව වාර්තා කිරීම, පරිභෝජනය භාවිත කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබාදීම, අයිතිය තහවුරු කර ගැනීම යන කරුණු මෙම යුගයේ ශිලා ලේඛනවල අන්තර්ගතය වශයෙන් දැක්විය හැකිය. මේ අතර ආරාම පිළිබඳ විමසීමේදී දිවයිනේ ඇතැම් මහා විහාර විහාරාරාම, විශේෂයෙන් නන්දන උයනෙහි ඇති ආරාම වැනි කීපයක් මූල බ්‍රාහ්මී යුගයේ දී විවෘත භූමි ආශ්‍රිතව ගොඩනගාගෙන තිබූ බවත් පිළිගත හැකි වේ. එහෙත් එබඳු ආරාමවලට බොහෝ විට රාජ්‍ය අනුග්‍රහය ද නොමදව ලැබුණු බව මෙහිලා සඳහන් කළ යුතුය.

පරිත්‍යාගශීලීන්ගේ නාමය අමරණීය කරගැනීම මෙමම යුද්ධ යුගයේ ශිලා ලේඛනවල එක් පරමාර්ථයක් බව පසක් වේ. බොහෝ ශිලාලේඛනවල තමාගේ පරම්පරාව ද සහිතව හෝ හුදු නාමය සමග පමණක් හෝ ශිලා ලේඛන සටහන් කොට තිබෙනු දැකිය හැකිය. ගජබාහු මහරජුගේ රුවන්වැලි සෑ දාගැබ් පුවරු ලිපිය මේ සඳහා කදිම නිදසුනකි. එහි පරිත්‍යාගශීලියා වන්නේ ගජබාහු රජතුමා ය. (ක්‍රි.ව.114-136) එතුමා හඳුන්වා ඇත්තේ " වහබ රජහ මණුමරක තිසමහරජහ පුති මහරජ ගයබහු ගමණි අබය" වශයෙනි. මෙහි

ප්‍රදානය කරනු ලබන්නේ ''මහරජ ගයබහු ගමිණි අබය" නම් රජකෙනෙකි. එම රජු කාගේ කවුරුදැ යි ශිලා ලේඛනයන්හි හඳුන්වා දෙයි. එම රජු වහබ මහරජුගේ මුණුබුරෙකි. (මරුමණක) එසේ ම තිස්ස නම් මහ රජු ගේ පුත්‍රයෙකි. මෙහි තිස්ස නම් වංකනාසික තිස්ස මහ රජතුමා ය (ක්‍රි.ව.111-114). එම රජුගේ පුත් මහරජ ගමිණි අබය නම් ගජබාහු ගමණි අබය යි. මෙම ප්‍රදානය කරනු ලබන්නේ ඔහු විසිනි. එවිට එම රජුගේ හා රාජ පරම්පරාවේ ද නාමයන් අමරණීය බවට පත්වේ. මෙම ප්‍රදානය සටහන් කරන ලද්දේ බොහෝ කල් පවත්නා ශිලා පුවරුවක් මතය (ඡ්‍රබ්ඩසඑය්බ්ගීග1983ථ90). ඇතැම් ශිලා ලිපිවල කෙළින්ම තම පරපුරු නාම ආදිය ප්‍රකාශ නොකොට ඍජුවම පරිත්‍යාග ශීලියාගේ නාමය ප්‍රකට කරයි. ගල්කිරිකන්ද ශිලාලේඛනය ඒ සඳහා කදිම නිදසුනකි. එහි ශිලා ලිපිය ආරම්භ කරන්නේ මංගල සූචක වදණෙනි. අනතුරුව ඍජුවම රජුගේ නාමය ප්‍රකාශ කරයි. "බතිය රජහ දින(කි)" වශයෙනි. එවිට එම රජු භාතිය හෝ දෙවන භාතිය රජු හෝ විය හැකිය. අක්ෂරවල ස්වරූප අනුව එම ශිලා ලිපියේ පරණවිතානයන් පළමු භාතිය රජු හෙවත් භාතිකතිස්ස (ක්‍රි.ව. 143-167) රජතුමාට අයත් කරයි (සඉසාථ118). කෙසේ වෙතත් ප්‍රථමයෙන් භාතිය නමින් සිටි රජතුමා අනාගතයේ භාතිය දෙවන නමින් රජ කෙනෙක් වසන්නේයැ යි අදහස් නොකරන බැවින් මෙම ශිලා ලේඛනයෙහි "බතිය මහරජහ" වශයෙන් යෙදීමෙන්ම තමන්ගේ නාමය අමරණීයත්වයට පත් කරගැනීම විෂයෙහි පැහැදිලිව පුදන්නාගේ නාමය සටහන් කිරීමෙන් පැහැදිලි වේ.

තමා ගේ නාමය අමරණීයත්වයට පත් කිරීමේ අරමුණින් ඇතැම් රජවරු තමාගේ නාමය යොදා විහාරස්ථාන ඉදි කළහ. දෙමටමල් විහාර ශිලා ලේඛනයේ ගෝඨාභය රජතුමා එම විහාරය තමාගේ නමින්ම නම් කළේය. "සිදම් ගොටක අබ රජහ විහරෙ" වශයෙන් එම ශිලා ලේඛනය ආරම්භ කොට තිබේ. යහපතක් වේවා ගෝඨාභය රජුගේ විහාරය යි යනු එහි තේරුමයි (Paranavithana.S.2001:132). මෙලෙස රජවරු විහාර නාමයටම තමාගේ නාමය යොදා කළ පරිත්‍යාගයන් ද මෙම යුගයේ ශිලාලේඛනවල දිස්වේ.

රජතුමා පමණක් නොව සාමාන්‍ය ජනයා ද එම කටයුත්තෙහි යෙදී සිටියේය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අලුත් ගල්විහාර ගිරි ලිපිය එවැන්නකි. එහි මෙතෙක් විහාරස්ථානයට පිදූ වැව් කුඹුරු ආදියෙහි නම් වට්ටෝරුවක් කියයි. අවසානයේ "තිස තෙරහ කලිහි ලිකිතකෙ" වශයෙන් අවසන් කොට තිබේ (ibid:230).

පරිත්‍යාග කළ දෑ පිළිබඳව වාර්තා කිරීම ද මෙම යුගයේ ශිලා ලේඛන පිහිටුවීමේ පරමාර්ථයක් විය. තමන් විසින් හෝ අන් අය විසින් හෝ පරිත්‍යාග කළ දේ පිළිබඳ බොහෝ ශිලා ලේඛනවල වාර්තා කොට තිබේ. ඒ අතර රජවරු බොහෝ විට වැව්, කුඹුරු, ඉඩම් ආදිය විහාරස්ථානවලට පරිත්‍යාග කොට ඒවා ශිලා ලේඛන මගින් වාර්තා කොට තබන ලදි. වෙස්සගිරි ගිරිලිපිය මේ සඳහා කදිම නිදසුනකි. එහි රජු තමන්ගේ පරම්පරාව රාජ්‍යත්වයට පත් වූ ආකාරය ද දක්වයි. සිරිනාග, වෝහාරක තිස්ස, දෙවන සිරිනාග, යන රාජ පරම්පරාවම කියා අවසන කරන ලද පරිත්‍යාගය කියයි. ඒ අනුව "පඩි පසහි කෙණහිසගම මණිකරගමක වවි ච මෙ අත අතරිසල" වශයෙන් එහි සටහන් වේ. බාහිරාර්ධයෙහි පිහිටි කෙණිහිස ගමත්, මණිකර ගමේ පිහිටි වැවත් විහාරයට පුදන ලැබූ බව එහි සටහන් වේ. මෙහි නිවැරදිව ම ඒ ඒ ස්ථාන දක්වා ඒවා වාර්තා කොට තිබේ (Paranavithana.S.2001:130). මීට අමතරව ඇතැම් ශිලා ලේඛනවල කිසිදු රජ කෙනෙක්, භික්ෂුවක්, විහාරස්ථානයක්, නමක් හෝ ගමක නමක් සඳහන් නොකොට අදාළ

විහාරස්ථානයේ ද දාගැබ හෝ ප්‍රධාන ස්මාරකය අභිමුඛයේ ශිලා ලේඛනයක් සනිටුහන් කොට එහි පුදන ලද දේ පිළිබඳ පමණක් වාර්තා ඇතුළත් කොට තිබේ. අනුරාධපුර විලච්චිය කෝරලේ කිරලාගම පිහිටි ගිරි ලිපියෙහි එම විහාරස්ථානයේ නමක් හෝ ගමෙහි නමක් හෝ අදාළ පුදන ලද අයගේ නමක් යන කිසිවක් සටහන් නොවේ. ඒ වෙනුවට එහි විවිධ ස්ථානවල ඇති කුඹුරු ලැයිස්තුවක් දක්වා පුදන ලද බවක් හෝ කිසිවක් නොකියා ශිලාලේඛනය අවසන් කොට තිබේ. එය හුදෙක් ඔප්පුවක් විලස විහාරයට පිදූ සියල්ල පිළිබඳ වාර්තාවකි. ස්ථාවර සටහනකි (ibid:239) තිස්සමහාරාමයෙහි පිහිටි සුලුන්නාකෙම ගිරි ලිපිය ද මේ සඳහා කදිම නිදසුනකි. එහි කුඹුරු හා කෙත්වලින් කරීෂ වශයෙන් කළ පරිත්‍යාගවල ලේඛනයක් පමණක් අඩංගු වේ. ඒ තුළ පරිත්‍යාග කළ අය හෝ පරිත්‍යාග කළ දිනයක් හෝ පරිත්‍යාග කළ ස්ථානය ආදී කිසිවක් සඳහන් නො වේ. (ibid:226). මෙලෙස ඔප්පුවක් ලෙස පිහිටුවන ලද ශිලාලේඛන පිහිටු වීමෙන් අපේක්ෂා කරන ලද්දේ ඒවා පිළිබඳ ස්ථාවර වාර්තා කථනයක් තබා ගැනීමයි. එම පිදුම් හෝ පරිත්‍යාග ලබන ආයතනයේ නම සඳහන් නොවුව ද එම ශිලා ලේඛනය සටහන් කළ ස්ථානයම එකී පිදුම් ලබන ස්ථානය ද වේ.

පූජා කළ දේ හා ඒවා භාවිත කළ යුතු ආකාරය පිළිබඳව පැහැදිලි උපදේශයක් ලබා දීම මෙම යුගයේ ශිලා ලේඛන පිහිටුවීමේ පරමාර්ථයන් අතර එක් පරමාර්ථයක් වශයෙන් පැවති බව පෙනේ. මෙම තත්ත්වය ඇති වූයේ ආරාම හා එහි අංග වර්ධනය වීමත් සමගය. මීට පෙර යුගයේ "විහරහි දිනි" නොඑසේ නම් "දනෙ" "දින" වශයෙන් කළ පූජාව මෙම යුගයේ දී පැහැදිලි අණක් හෝ එම ප්‍රතිලාභ භාවිත කළ යුතු ආකාරය හෝ සෘජුව සම්මත කර තබන්නක් විය. මෙම යුගයේ විහාරස්ථාන මෙන්ම ඒවායේ විහාරාංග ද වර්ධනය විය. විහාරස්ථානයක නවකම් කිරීමට හෝ නවීන ඉදිකිරීම් කිරීමට හෝ ස්ථාවර ධනයක් ලබාදීමේ අවශ්‍යතාවයක් පැන නැගිණි. මේ නිසා පිදීම් සිදු කොට ඒවා භාවිත කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි උපදේශයක් ලබා දීම ද මෙම යුගයේ ශිලා ලේඛනවල අන්තර්ගත වේ. එසේ ප්‍රදානයනන් ලද විහාරාංග ද කිහිපයකි. පතනගල (පධානඝරය) පොහොකර/පොහොතගර (පොහොය ගේ / උපෝසථඝර ය) චෙත (දාගැබ) බොතගෙ (බෝධිඝරය) මහපකවට (මහාදාන ශාලාව) ආදිය ඒ අතර වේ. නොඑසේ නම් "බිකුසගහ චතරිපචයෙ පරිබුජනක වශයෙන් භික්ෂු සංඝයාගේ පරිභෝජනය උදෙසා පිදූ බව සෘජුව කියයි. වසභ රජුගේ අමාත්‍යයෙකු එරාවූර් පත්තුවෙහි විහාරයක මහා ථූපයක් ඉදිකරයි. එසේ ඉදි කොට එහි චිර පැවැත්ම හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කුඹුරු ප්‍රමාණයක් ද පුදයි. එසේ පුදා මෙලෙස විධානයක් ලබා දෙයි. "මෙදො විසිකරිහි....මහතුබහි දකරනිය චතමුද චෙතිසෙහි හවජර තිණි කිල මකනකෙ උතරික අතු හිත තුබහි ජිනපඩිසතරිය දජ අරුවනෙක තුබහි කම කරන දිවස හමණක අටය බත හද (රක) හට දින. කොළ හොබකහි දොකරිහකෙ" මේ කරීෂ විසිදෙකෙන් (22) මහාථූපයෙහි දකරණිය, ඡත්‍රය, මුද්දවේදියෙහි අවුරුදු තුනකට වරක් තෙල් ගැල්විය යුතුයි. ඉතිරියක් ඇතොත් ථූපයෙහි දිරූ දේ ප්‍රතිසංස්කරණය කොට කොඩි ද නැංවිය යුතුයි. ථූපයෙහි පිංකම කරන දිනයෙහි සංඝයාට දන් දීමට කොලහොබකෙහි දෙකිරියක් වෙන් කොට තිබේ. මේ තුළින් පෙනෙන්නේ පරිත්‍යාගය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි විධානයක් සටහන් කොට තැබීමට මෙම යුගයේ අභිලේඛනවලින් අපේක්ෂා කොට ඇති බවයි (Paranavithana.S.1933:74).

ගජබාහු රජුගේ සිතුල්පව්ව පුවරු ලිපියෙහි දෛනික පරිත්‍යාගයක් පිළිබඳ ස්ථාවර නියෝගයක් සටහන්වේ. එහි මගගම විනිශ්චය ශාලාවෙන් ලැබෙන දඩ ආදායමෙන්

දිනපතා කහවණු දෙකක් සිතුල්පව්ව විහාරයෙහි සියලු සංඝයාගේ බෙහෙත් වියදම සඳහා ලබාදීමට නියෝගයක් පනවා තිබේ. "මහගමන මහ විනිචහි ලබනක වටිති දිවස දෙ කහවණි ගණිය එක දිවස දො කහවණ මගිනි චිතල පවත විහරහි බිකුසගහටය බෙසජ වටකොටු දිනි" වශයෙන් එම නියෝගය ශිලාලේඛනයක සටහන් කොට ස්ථාවර කොට තිබේ (ibid:96). මේ තුළින් ලබා දෙනු ලබන පූජාවේ ස්වභාවය ඒවා වියදම් කළ යුතු ආකාරය පිළිබඳ ස්ථාවර නියෝගයක් ලබා දීමක් සිදුව තිබෙන බව පසක් වේ. ගෝඨාභය රජුගේ ගොඩවාය ශිලා ලේඛනය ද මෙවැන්නකි. ගොඩවාය යනු එකල වූ වරායකි. එම වරායෙන් දෛනික ආදායම් ලැබේ. එම ආදායම (හෝ ඉන් කොටසක් විය හැකිය) විහාරයට පිදූ බව එහි ''සිදධම ගොට පවත පටනහි සුත සුහිරි රජ ගමණි අබය විහරට දිනි'' යනුවෙන් සටහන් කොට තිජේ. යහපතක් වේවා ගෝටපබ්බත පටුනෙහි (වරායෙහි) රේගු බද්ද (Custom Duty) ගාමණී අභයරාජ විහාරයට පුදන ලදි" යනු එහි තේරුමයි. මේ අනුව පරිත්‍යාගය භාවිත කළ යුතු ආකාරය ද ඉතා පැහැදිලිව මෙම යුගයේ ශිලා ලේඛන වල සටහන් කොට තිබෙන අයුරු පසක් වේ. මේ සම්බන්ධයෙන් දැක්විය හැකි තවත් අතිශය විශේෂ ශිලාලේඛනයක් වන්නේ තෝනිගල ශිලා ලේඛනයයි. තෝනිගල ශිලා ලේඛනය රජ කෙනෙක් විසින් පිහිටවූවක් නොවේ (E.Z.Vol.III:1933:78). එය පිහිටවනු ලබන්නේ ප්‍රභූවරයෙකු විසිනි.

කිත්සිරිමෙවන් රජුගේ ඇමතිවරයෙකුගේ පුත්‍රයකු වූ දේව නම් තැනැත්තා යහිසපව් විහාරයෙහි අරියවංස නම් උත්සවය පැවැත්වීම සඳහා අනුරාධපුරයේ උතුරින් පිහිටි කළහුමනක නියමතන නම් ස්ථානයේ උඳු, වී, මුං යන ධාන්‍ය තැන්පත් කොට එහි පොලිය පමණක් වියදම් කොට වාර්ෂිකව අරියවංශ උත්සවය පැවැත්විය යුතු ආකාරයත් එහි දී දානය සඳහා ගත යුතු ආහාර පිළිබඳ සීට්ටුවකුත් සඳහන් කොට තිබේ. තව ද එමගින් ස්ථාවරව එම පිංකම පැවැත්වීමට හැකිවන ආකාරයෙන් විධිවිධාන සලසා ඇති බව ද එමගින් ප්‍රකට වේ (ibid:79).

මෙලෙස මෙම යුගයට අයත් ශිලා ලේඛන බොහොමයකම පරිත්‍යාගය හා පරිත්‍යාගය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ විධාන අඩංගු කොට තිබේ. මේ නිසා කාලයාගේ ඇවෑමෙන් මෙලෙස ස්ථාවරව විහාරස්ථාන වෙත ලබා දෙනු ලබන දීමනා හා ධනෝපායන මාර්ග හිතුමතේ වියදම් කිරීම හා අයාලේ යෙදවීම නවත්වා ගැනීමට අවකාශ සැලසුන බව එයින් පසක් වේ. විවිධ පාලකයන් හෝ පාලන කණ්ඩායම් පැමිණි පසු මූලික අපේක්ෂාවන්ගෙන් පරිබාහිරව එකී ප්‍රධානයන් භාවිත කිරීම වලක්වාලීම මෙහි අරමුණ වූ බව පෙනේ.

ප්‍රචාරක මාධ්‍යක් වශයෙන් ද එම යුගයේ ශිලා ලේඛන භාවිත වූ බවට සාධක තිබේ. මහසෙන් රජුගේ ජේතවන ශිලාලිපිය එවැන්නකි. එහි කොටසක් කැඩී ගොස් තිබුණ ද සංඝයාගේ හැසිරීම පිළිබඳව රජු විසින් නිකුත් කළ අවවාද ඇතුළත් වන්නට ඇති බව විශ්වාස කෙරෙන මෙම ශිලා ලිපියේ දැක්වෙන ආකාරයට මෙකී විවිධ පොත්වල ලියා තිබී ඇති බව පසක් වේ (Paranavithana.S.2001:191-192). මෙහි තවත් වැදගත් තොරතුරක් අඩංගු වේ. එනම් මෙම ශිලා ලේඛනයෙහිම තවත් කොපි කිහිපයක් අභයගිරිය මහා විහාරයෙහි හා මහවත සිව්මංසලහිත් ස්ථාපනය කරන ලද බව එහි සටහන් වීමයි (ibid:192). මෙනිසා තත් යුගයේ ශිලා ලේඛන වලින් හෙවත් ඒවා පිහිටුවීමෙන් ප්‍රචාරක මාධ්‍යයක් වශයෙන් ඒවා භාවිත කිරීමට අපේක්ෂා කළ බව ද ඉන් පසක් වේ. මීට සරිලන තවත් නිදසුනක් කණිට්ඨතිස්ස රජුගේ රුවන්වැලි සෑ පුවරු

ලිපියකින් සනාථ වේ. එහි පරිත්‍යාගයන් සිදුකොට අවසාන මෙසේ සටහන් කරයි. "මේ වවි දිනෙ පණ ලොහො වහතෙහි බඩගැබෙහි ලබිති" එයින් කියවෙන්නේ මෙකී පරිත්‍යාග යන් පිළිබඳ ලේඛනය ලෝහ ප්‍රාසාදයේ භාණ්ඩාගාර සේප්පුවේ තැන්පත් කොට ඇති බවයි (Paranavithana.S.2001:131). ශිලා ලේඛනයට අමතරව එය ඔප්පුවක් වශයෙන් ද භාවිතා කළ බවත්, එම ඔප්පුව ලෝහ ප්‍රාසාදයේ සේප්පුවෙහි තැන්පත් කොට තිබෙන බවත් මෙයින් ප්‍රකාශිත වේ. මේ ආකාරයෙන් මෙම යුගයේ ශිලා ලේඛන ප්‍රචාරක මාධ්‍යක් වශයෙන් ද භාවිතයේ පැවති බව නිගමනය කළ හැකිය.

ශිලා ලේඛන වල අන්තර්ගතය තුළ පුණ්‍යානුමෝදනාවන් ද ඇතැම් විට අන්තර්ගතව තිබේ. රුවන්වැලි සෑ මළුවෙහි ඇති කැඩීගිය ටැඹක කොටසක ශිලා ලේඛනයක් දිස්වෙයි. එහි තිබෙන අක්ෂර හා අන්තර්ගතය අනුව එම ශිලා ලේඛනය බුද්ධදාස රාජ සමයට අයත් වේ (ක්‍රි.ව.337-365). එහි මෙසේ සඳහන් වේ. ".....සිරිමෙක ජෙටතිස මහරජ අපයහ පුත බුදදස මහසෙන මහර(ජ)....(ම) හිලකණ කරක සුමනයහ පුත මහලකණකරක සිවයහ මහිලකණ කරක....ජිත කබල අබකරවික ටබි සවතනට පෙත අනුමොවතු මපුරුමුකහට වෙඪ වයු" ඒ අනුව මෙයින් ''සිරිමේඝ ජෙට්ඨතිස්ස අබයගේ පුතාවූ බුද්ධදාස මහාසේන මහරජු .....මේ ශිලා ස්ථම්භය පිහිටුවන ලද්දේ මකලක නම් නගරයේ කබල අව නම් දියණියගේ හා මහිල නගරයේ සුමන යන අයගේ පුත් වූ මහිල නගරයෙහි ශිව විසිනි.'' මේ පින සියලු සත්වයන්ට අත් වේවා! මහරජුගේ කීර්ති පුණ්‍ය මහිමය ද වර්ධනය වේවා යි මෙහි දක්වා තිබේ (E.I.Vol.III:1933:122). සාමාන්‍යයෙන් මෙම යුගයේ පුණ්‍යානුමෝදනාවක් සටහන් වන මෙබඳු ශිලා ලේඛන බෙහෙවින් අඩු ය. එහෙත් වහරල ශිලා ලේඛන හා එම ශිලාලේඛනය අයත් යුගයෙහි පුණ්‍යානුමෝදනා බෙහෙවින් වැඩිය. කෙසේ වෙතත් එම යුගයේ ප්‍රකටව කරන ලද කුසල් සියලු සත්ත්වයින්ට අනුමෝදන් කිරීම, රජුගේ ශක්තිය හා බලය වර්ධනය වන ලෙස සෙත් පැතීමක් සිදුව තිබෙන බව මින් ප්‍රකට වේ. මෙහි සඳහන් "සිව" බොහෝවිට නගර ගුත්තිකයෙකු හෝ නගරයේ ප්‍රධානියෙක් විය හැකිය. ඇරත් බුද්ධදාස රජතුමා සමස්ත සතුන් සහිත රටවැසියාගේ ම යහපත වෙනුවෙන් සමාජ සුබසාධන කටයුතු බොහොමයක් ඉටු කළ ජනප්‍රසාදය ඉහලින් දිනාගත් රජකෙනෙක් වන බැවින් මෙබඳු ප්‍රාර්ථනාවක් රට වැසියාගෙන් කුමන තරාතිරමක අයෙකුගෙන් හෝ සිදු වන්නට ද බැරි කමක් නැත.

මෙම යුගයට අයත් තවත් කෙටි සෙල් ලිපි වර්ගයක් වේ. ඒවා සීමාකණු වශයෙන් හඳුන්වනු ලැබේ. සීමා දෙවර්ගයකි. සාමාන්‍යයෙන් මෙම සීමා කණු විහාරයකට අයත් බිම් හෝ වෙනත් රජු හෝ ජනපධානියකු විසින් නම් කරනු ලැබූ විට ඒවා 'සීමා' වශයෙන් සලකනු ලැබේ. මෙහිදී ද සීමා නිමිත්ත වශයෙන් සලකනු ලැබූ සීමාවෙන් ඇතුළත පිහිටි විට ඒවා 'සීමි' වශයෙන් සිටී. සීමාවෙන් පිටත සීමා කණුව පිහිටි විට එයට 'නිස්සීමා' යනු භාවිතයේ විය. "නිසිමි" "නිසිම" වශයෙන් ශිලාලේඛනවල ඒවා දක්නට ලැබේ (හෙට්ටිආරච්චි.එච්.ඒ.එස්.1990:32). ''සිමි'' වශයෙන් යෙදුණු අවස්ථාවක් හෙවත් සීමාව දක්වා ඒවා සීමා වශයෙන් හඳුන්වා දුන් අවස්ථාවක් තෙන්නකෝන්ගම ගිරිලිපියෙන් ලැබේ. එහි එක් ශිලා ලේඛනයක "ගාමිනි අබ රජෙ දිනි සිමි" වශයෙන් දක්වා තිබේ (Paranavithana.S.2001:103). ''ගාමණී අභය රජදුන් සීමාව''යි වශයෙන් එය කියැවේ. එහි ම දෙවන ශිලා ලේඛනයෙහි "දොර අවිරණිහි රට කරවක පිතිනි මසකල බලකහි සිමි දකිනි බර කබුබවිලකහි කුපපලිවකිනි සිමි ලහබක පිටිසකෙනි වජකහ පොත තතනි සිමි" වශයෙන් දක්වා තිබේ. පරණවිතාන ද දක්වන පරිදි අදාළ

සීමාව සහ ඊට අයත් හඳුනාගත හැකි සලකුණු හා ස්ථාන මෙම කොටසින් සටහන් කොට තිබේ. නූතනයේ ඔප්පුවල උතුරෙන්, දකුණෙන් අදාළ ඉඩමට සීමා මේයැ යි දක්වන ආකාරයට මෙහි ද අදාළ සීමාව දක්වා තිබේ (Paranavithana.S.1933:(03).

අදාළ සීමාව සටහන් කරන වස්තු හෝ ඉඩම් ආදියෙන් පිට පිහිටි විට ඒවාට "නිස්සීමා" යන වදන භාවිත කරනු ලැබේ. ශිලා ලේඛන කිහිපයක ම මෙම යුගයට අදාළව මෙම යෙදුම හමු වී තිබේ. තම්මැන්නාව ගිරිලිපිය එබඳු "නිස්සීමා" දැක් වූ අවස්ථාවට නිදසුනකි. ඊට අමතරව එම ශිලා ලිපිය වසභ මහ රජුගේ පුත් "දුටග" නම් මහ රජ කෙනෙකුන් ගේ නිස්සීමාවක් ද වේ. එහි මෙසේ සටහන් වේ. ''සිධම වහභ මහ රජෙහ පුත දුටග මහරජහ නිසෙ'' වසභමහරජුගේ පුත්‍ර දුටග මහරජුගේ නිස්සීමවයි යනු එහි අර්ථයයි (ibid:192). මෙහින් එම රජුට අයත් බලාධිකාරය පැවැති සීමාව සලකුණු කළ බව පෙනේ. එසේම එයින් එම රජු ප්‍රාදේශීය රජ කෙනෙකුන් යන්නට ද ඉඟියක් ලැබේ. විහාරස්ථානයකට නිස්සීමා සලකුණු කිරීමක් පිළිබඳ කදිම නිදසුනක් වන්නි හත් පත්තුවේ අස්සැද්දුම ගිරි ලිපියෙන් ලැබේ. එහි "පති (දක) විහරහි නිසිම් දිනි නිසිම්" වශයෙන් එහි සටහන් වේ. 'පතිදක විහාරයේ නස්සීමා දීමනාව' යි යනුවෙන් ඊට අර්ථ කිවයුතු වේ. කෙසේ වෙතත් සීමා කරුණු පැහැදිලිවම හා සීමා සලකුණු කොට ඒවා ලියා තැබීම මේ යුගයේ ක්‍රියාත්මකව පැවති බවට මෙය කදිම නිදසුනකි.

මෙම යුගයට අයත් තව තවත් ශිලා ලේඛන වර්ගයක් වශයෙන් පියගැට පූජා කිරීම හා ඒවා නම් කිරීම හඳුන්වාදිය හැකිය. මෙය නූතනයේ දී ද දැකිය හැකි ලක්ෂණයකි. බොහෝ විට මේවා සාමාන්‍ය ජනයාට අයත් ය. පිටගැට කෙටවීම සඳහා අදාළ වියදම් දරා එම කාර්යය නිම කිරීමෙන් පසු එය පිදූ අයගේ නාමය සටහන් කිරීම සිදු ව තිබේ. පියගැටවලට කෙණි, ගද, ගට යන වදන් භාවිතව තිබේ. අනුරාධපුරය වෙස්සගිරියෙන් ලැබුණු ගිරි ලිපියක "සිධ මහයහ (පු)ත මහ (ර) ක අසෙලයහ කෙණි" වශයෙන් සටහන් වේ. (Paranavithana.S.2001:(223). මෙහි "කෙණි" යන්න "හිනි" යන අර්ථයෙහි යෙදේ. හිනි (මග) ඉනි (මඟ) බවට පත් වූයේ පසු කාලයේ ය. පතගට්, පයගට්, පදගඩ යන වදන් ද මෙම යුගයේ ශිලා පළක හෝ පියගැට හැඳින්වීමට යෙදී තිබේ. දඹුල්ලෙන් ලද ගිරි ලිපියක "අමතයව (ව)-හබ (හ) තිණි පත ගටෙ" වශයෙන් සටහන් වී තිබේ (EN.1991:46). වහබ නමින් වූ අමාත්‍යවරයා පිදූ පියගැට තුන යි යනු ඊට අර්ථ වේ. පුණ්‍යානුමෝදනා සමග පිදූ පියගැටයක් පිළිබඳව සටහන් ශිලාලේඛනයක් මොණරාගල රජමහා විහාරයෙන් හමුවී තිබේ. එහි "සෙනවි මහ....කන කවිරක පදගඩිනි සව සතහට (පති)" යනුවෙන් එහි සටහන්ව තිබේ (හෙට්ටිආරච්චි.ඒඑස්.1990:33). මහාතැන කර වූ පියගැටයි. සියලු සත්ත්වයන් (එපින්) අත්වේවා යනු එහි තේරුම යි. මෙසේ පුණ්‍යානුමෝදනාව මෙන්ම සාමාන්‍ය මහජනයා විහාරාරාමවල විවිධාංග සකස් කොට පිදූ බවට ද මෙම යුගයේ ප්‍රමාණවත් සාධක ලැබේ.

ගිරි ලිපි භාවිතය පිළිබඳ සාකච්ඡා කිරීමේදී මෙම යුගයෙන් ලැබෙන බොහෝමයක් ම ලිපි හෙවත් සාතිශය බහුතරයක් ලිපි ගිරිලිපි වශයෙන් හැඳික්විය හැකි ය. ඉඳහිට පුවරු ලිපි හා ටැම් ලිපි ද හමුවේ. මුලින් දක්වා ඇති පරිදි මෙම ලිපි සඳහා තලය සකස් කර ගැනීමක් සිදු කොට නොමැත. මෙනිසා පිහිටි පර්වතවල වඩාත් දර්ශනය වන තන්හි මේවා සටහන් කොට තිබේ. ගිරිලිපි භාවිතයේ දී වැඩි වදන් ප්‍රමාණයක් සටහන් කරන්නට හැකි වීම මෙහිදී ඉතා වැදගත් කරුණක් ලෙසට සැලකිය හැකිය. මෙම යුගය වන විට බ්‍රාහ්මී අක්ෂර භාවිතය හා භාෂාවේ වර්ධනය යම් පමණකට වර්ධනය

ව පැවැති බව නිගමනය කළ හැකිය. මෙනිසා ලම්බකර්ණ රාජ වංශිකයින්ගේ යුගය මෙරට පාලි සංස්කෘත භාෂා ද හොඳින් භාවිත වූ කාල පරිච්ඡේදයක් වන බැවින් භාෂාව ද වේගයෙන් වර්ධනය වන්නට වූ බව පෙනේ.

## නිගමනය

පළමු ලම්බකර්ණ රාජ වංශිකයන්ගේ පරිපාලන යුගය වශයෙන් ගැණෙන මෙම කාල පරිච්ඡේදයේදී අභිලේඛන හා භාෂාවේ ද විශේෂ වෙනසක් සිදුව තිබෙන බව පසක් වේ. එසේම අභිලේඛනයන්හි අන්තර්ගතය හා ඒවා සටහන් කිරීමේ ශිල්පක්‍රමයේද ද විශේෂ වෙනසක් මේ යුගය තුළින් නිරීක්ෂණය කළ හැකි ය. මේ තත්ත්වය සඳහා ඔවුන් යම් ලේඛක පලරම්පරාවකින් පැවත එන බවට පළව ඇති මතයන්හි යම් සාධනීය බවක් ඇති බව ද මෙහිදී පසක් වේ. තව ද මේ යුගයේ අර්ථික තත්ත්වය හා සමාජ යාන්ත්‍රණය ද යම් විශේෂ වර්ධනයක් පෙන්නුම් කරන බැවින් එම තත්ත්වයන් ද මේ සඳහා හේතු වී තිබෙන බව අවබෝධ කට හැකි ය. මේ කරරුණු සියල්ලම ගෙන බැලීමේදී මේ යුගයේ අභිලේඛනයන්හි විශේෂ වෙනසක් මෙන්ම තත් ලිඛිත භාෂාවේ ද වර්ධනයක් පෙන්නුම් කෙරෙන බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංස හිමි කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, (1969), සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ගුණසේකර බන්දුසේන, සිංහල අක්ෂර සම්භවය හා එහි විකාශය, (1996), සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ගෛගර් විල්හෙල්ම්, සිංහලයේ වාග් විද්‍යාත්මක ස්වරූපය, බලගල්ල විමල් ජී. සිංහල පරි., (2001), විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

බලගල්ලේ විමල් ජී. සිංහල භාෂාවේ ආරම්භය හා විකාශය, (1998), අපේ සංස්කෘතික උරුමය, II දෙවන කාණ්ඩය, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, කොළඹ.

මුදියන්සේ නන්දසේන, සිංහල අකුරුවල ඉතිහාසය, (2018), සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ලංකාගේ ජයසිරි, සිංහල වර්ණ මාලාවේ විකාශනය, (1996), ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විමලඛන්ති හිමි ගල්වැවේ, සිංහල අක්ෂර රූප කෙරෙහි බලපෑ දක්ෂින භාරතීය ආභාසය, ආරම්භයේ සිට ක්‍රි.ව.07 වන සියවස දක්වා, විචාර පූර්වක විමර්ශනයක්, (2014), අමුද්‍රිත පශ්චාත් උපාධි නිබන්ධනය.

විමලඛන්ති හිමි ගල්වැවේ, ලජ්ජිතිස්ස මහරජුගේ කැලෑපිටිමුල්ල පුවරු ලිපිය, ප්‍රවචන, 07 කලාපය, 01 වන අංකය, (2016), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

විමලානන්ද තෙන්නකෝන්, පැරණි ලංකාව හා ශිලාලිපි, (1957), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

හෙට්ටිආරච්චි ඒ. එස්, 2-3-4 සියවස්හි සෙල්ලිපි විමර්ශනය, අභිලේඛණ (1990), නනන්දදේව විජේසේකර සංස්. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශත සංවත්සරය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

Archaeological Survey of India, Report for the Year 1872-1873, Vol. V.,(1875), by Alexander Cunningham, Culcutta.

Archaeological Survey of Western India, Inscriptions of the Cave Temples of Western India, (1881), Jas Burgess and Bhagawanlas Indraji Pandith, Government Central Press.

Epigraphia Indica, Vol. XX, (1933), Edited by Hirananda Sastri, Published by Director General, Archaeological Survey of India, anapath, New Delhi.

Epigraphia Zeylanica, Vol. I., (1912), Edited by Wickramasinghe D.M.De Z., Published for the Government of Ceylon by Humphrey Milford, Oxford University Press, Amen House, London.

Epigraphia Zeylanica, Vol. III., (1933), Edited by Wickramasinghe D.M.De Z., Codrington, H.W., Published for the Government of Ceylon by Humphrey Milford, Oxford University Press, Amen House, London.

Epigraphia Zeylanica, Vol. IV, (1943), Edited by Paranavitana S., Published for the Government of Ceylon by Humphrey Milford, Oxford University Press, Amen House, London.

Epigraphia Zeylanica, Vol. V., (1955), Edited by Paranavitana S., Archaeological Commissioner, Government Press, Ceylon.

Epigraphical Noted, Dias Malini, (1991), Department of Archaeology, Colombo 07.

Fernando P.E.E.,Palaeographical Development of the Brahmi Script in Ceylon from 3rd Century B. C. to 7th Century A. D., (1949),University of Ceylon Review, Vol. VII, No. 4, Peradeniya.

Gunasekara Bandusena, The Evolution of the Sinhalese Scripts from the 6th to the 10th Century, (1999), Godage Poth Madura, Colombo.

Indian Antiquary, Vol. X, (1881), Edited by Jas Burgess, A Journal of a Oriented Research, Swati Publications, (1984) Re printed, India.

Karunarathna Saddhamangala, Epigraphia Zeylanica, Vol. VII, (1984), Government Press, Department of Archaeology, Ceylon.

Paranavitana Senarath, Inscriptions of Ceylon, Vol.I, (1970) Government Press, Department of Archaeology, Ceylon.

Paranavitana Senarath, Inscriptions of Ceylon, Vol.II, Part I., (1983) Government Press, Department of Archaeology, Sri Lanka.

Paranavitana Senarath, Inscriptions of Ceylon, Vol.II, Part II., (2001) Government Press, Department of Archaeology, Sri Lanka.

Vimalananda T., The Epigraphy and Paleography of CeylonDown to the 10th Century A.D., Phd Thesis Submitted to the University of London.

Wimalakhanthi Rev. Galwewe, Kongrayankulam Rock Inscription of King Bhatikabhaya, (2014), Pravachana, Vol. 5 No. 02, Bhiksu University of Sri Lanka, Anuradhapura.